# මෞර්ය අධිරාජ්‍යයේ පරිහානිය හා බිඳ වැටීම පිළිබඳ විමර්ශනයක්.

ආචාර්ය දර්ශන බණ්ඩාර

ලෝකයේ පැවති වැදගත් ශිෂ්ටාචාරයක් වූ මෞර්යයන්ගේ බිඳවැටීම අශෝක අධිරාජ්‍යයාගෙන් පසුව රාජධානියේ පරිහානියක් සමග ඇතිවූ බව පෙනී යයි. මුළු මහත් ඉන්දියාවම වසා පැතිර ගිය මෞර්ය ශිෂ්ටාචාරය ක්‍රිපු 232 දී අශෝක ගේ අභාවයෙන් පසුව ක්‍රමයෙන් පරිහානියට ගමන්කරන අතර ඉන්පසු බිඳ වැටීමට ලක්වේ. දීර්ඝ කාලයක් ස්ථාවර අඩියක පැවති සමාජ ආර්ථික දේශපාලන රටාවක් එක් ප්‍රබල හේතුවක් නිසා බිඳ වැටුණු අවස්ථාවන් ලෝක ඉතිහාසය පුරා හමුවේ.

මහාචාර්ය ඩී කැස්පාරිස් පෙන්වා දෙන අන්දමට මෙලෙස ප්‍රබල හේතුවකින් මෞර්ය ශිෂ්ටාචාරය ඉක්මණින් බිඳ වැටීමට ලක්වුවද, ශිෂ්ටාචාරයේ සමෘද්ධිය පිටුපස එය බිඳවැටීමට ඉවහල් වූ අඳුරු සෙවණැලි සැඟව තිබූ බවට ඉතිහාසඥයින් තුළ මතවාද පවති. ඒ අනුව මෞර්යයන්ගේ බිඳවැටීමට ඉවහල්වූ කෙටි කාලීන හා දීර්ඝකාලීන හේතු හඳුනාගැනීම වැදගත්වේ.

## ආසන්නම හේතුව

ක්‍රි.පු 185 දී මෞර්ය පාලකයා ලෙස කටයුතු කළ බෘහද්රථ රජු ඔහුගේ සේනාපති 'පුෂ්‍යමිත්‍ර සුංග අතින් ඝාතනයට ලක්වේ. මෞර්ය සේනාවන්ගේ සම්මාන ආචාර පෙළපාළියක් පරික්ෂා කිරීමට ගිය අවස්ථාවේ සේනාපතිවරයා රජු ඝාතනය කරන්නේ සේනාව ඉදිරිපිටදීම ය. සේනාවේ පක්ෂපාතීත්වය ද දිනාගෙන සිදුකරන ලද ඝාතනයක් මෙමගින් නිරූපණය වේ. මෞර්ය අධිරාජ්‍යයාගේ අවසන් කාලයේදී සේනාව පවා රජු කෙරෙහි කලකිරී සිටි බව පැහැදිලි වේ.

## දීර්ඝකාලීන හේතු

මෞර්ය අධිරාජ්‍ය බිඳවැටීමට ඉවහල් වූ දීර්ඝකාලීන හේතු ගණනාවක් පිළිබඳ ඉතිහාසඥයින්ගේ අවධානය යොමු වී ඇත. ඒවා පිළිබඳව වෙන වෙනම විමසා බැලීම වැදගත් වේ.

### 01. අශෝකට පසු ශ්‍රේෂ්ඨ අනුප්‍රාප්තිකයෙකු පත්නොවීම

අශෝක රජුගෙන් පසු මුළු ඉන්දියාවේම පැතිර ගිය මෞර්ය අධිරාජ්‍යය පාලනය කිරීමට ප්‍රබල තනි පාලකයෙකු පත් නොවිය. අශෝකගේ පුතුන් 11 ක් පිළිබඳව ටිබෙට් ග්‍රන්ථ වල දක්වුවද ඉන්දියානු මූලාශ්‍රවල දක්වෙන්නේ පුතුන් තිදෙනෙකු ගැන පමණි.

01. කුණාල

02. ජලෞක

03. තිවර

අශෝකගේ සෙල්ලිපිවල වැඩි වශයෙන් දක්වෙන්නේ තිවර පිළිබඳවයි. නමුත් ඔහු රජ වූ බවක් නොපෙනේ. අශෝකට පෙර තීවර මියයන්නට ඇති බව විශ්වාස කෙරේ. ඉන්දියාවේ ප්‍රබල මෞර්ය අධිරාජ්‍ය පාලනය කිරීමට අශෝක වැනි ප්‍රබල පාලකයෙකු නැවත පත් නොවීම මෞර්ය අධිරාජ්‍යයේ පරිහානියට බලපෑ බව ඉතිහාසඥයන්ගේ මතයයි.

## 02. මෞර්යන්ගේ පසුකාලීන පාලකයන් දුර්වලයන් වීම

අශෝකට පසු මෞර්ය අධිරාජ්‍යයේ රජ වූ අනෙකුත් පාලකයන් දේශපාලකයන් වශයෙන් කීර්තිමත්, රණශූර පාලකයෙකු වූ බවක් නොපෙනේ. මෞර්ය අධිරාජ්‍යයේ කොටස්වලට කැඩියාමක් පසුකාලයේදී දකගත හැකිය. අශෝකගේ මෞර්ය අධිරාජ්‍ය මුලින්ම පුතුන් දෙදෙනකු අතර බෙදී යයි. ඉන්පසු එය තවත් කොටස්වලට බෙදී යන්නට ඇති බව පෙනේ. අශෝකගේ මුණුපුරන් 4 දෙනෙකු පිළිබඳ මූලාශ්‍රවල තොරතුරු දක්වේ.

01. බණ්ධුපාලිත

02. දශරථ

03. ශාලිශූක

04. සම්ප්‍රති

05. දේවවර්මන්

06. ශතත් ධනුෂ්

07. බෘහද්‍රථ

මෙම මුණුපුරන් 7 දෙනාය. ඔහුන්ද ප්‍රතිපත්ති විරහිත පාලකයන් බව පෙනේ. ඔවුන් ඇදහූ ආගම්වල වෙනස පහත පරිදි ය.

| | | |
|---|---|---|
| 1. | කුණාල | බෞද්ධ |
| 2. | ජලෞක | ශිව භක්තික |
| 3. | ශාලිශූක | ශිව |
| 4. | දශරථ | ආජීවක |
| 5. | සම්ප්‍රති | ජෛන |

මෙම ආගමික වෙනස්වීම අතින් පෙන්නුම් කරන්නේ එක් මතවාදයක් ඔවුන් තුළ නොපැවති බවයි. ප්‍රතිපත්ති විරහිත දුර්වල පාලකයන් ලෙස මොවුන් ඉතිහාස ගතවී ඇත. යම් මට්ටමකට ප්‍රබල

පාලකයෙකු වූයේ දශරථ පමණි. මෞර්ය අධිරාජ්‍ය පාලනය කිරීමට තරම් ප්‍රබලයෙක් නැවත ඉස්මතු නොවීමට මෙහි පරිහානියට බලපා ඇත.

## 03. මෞර්ය අධිරාජ්‍යයට එරෙහිව දේශිය සහ විදේශිය බලපෑම් එල්ලවීම

මෞර්ය අධිරාජයයේ ප්‍රබලත්වය අශෝකගෙන් පසු ගිලිහි යයි. ප්‍රත්‍යන්ත ප්‍රදේශවල මෞර්යයන්ට එරෙහි කැරලි සහ නිදහස් සටන් උත්සන්න වේ. අවසානයේදී මෞර්යයන්ගේ බලයෙන් බොහෝ ප්‍රදේශ නිදහස ලබාගනී.

1. ගාන්ධාරයේ වීරසේන නම් ස්වාධීන කුමාරයෙකුද

2. ඉන්දු නිම්නයේ සුබාගසේන නම් ග්‍රීක රජුවද

3. කාලිංගයේ චේතවරන්ටද

4. ඩෙකානය ශානවහානවරුන්ටද

අයත් වේ. මගධයේ බලය ක්‍රමයෙන් දකුණු ඉන්දියාවෙන් සහ ඩෙකාන් ප්‍රදේශවලින්ද වයඹ දිග ඉන්දියානු ප්‍රදේශ වලින්ද අවසන්ව ගිය බව මේ අනුව පෙනේ. මෙකල ග්‍රීක පාලකයා වූ ඩිමේට්‍රියස් රජු බෘහද්රථ රජුගේ රාජධානියේ කොටසක් උදුරාගෙන ඇත. ගර්හිසංහිතාව අනුව අවසන් කාලයේ ග්‍රීක ආක්‍රමණ පාඨලිපුත්‍රය දක්වා එල්ලවී ඇත. දේශිය සහ විදේශිය සතුරන් මැද බිඳවැටෙන මෞර්ය අධිරාජ්‍යයක පාලකයන් ලෙස ඉහත පාලකයන් කටයුතු කරන්නට ඇති බව හඳුනාගත හැකිය.

## 04. බ්‍රාහ්මන විරෝධය මෞර්ය බලය අවසන් කිරීමට බලපෑ බව

මගධයේ බිඳවැටීම සඳහා බ්‍රාහ්මණ විරෝධතා එල්ලවීම හා බ්‍රාහ්මණයින් සංවිධානය වීම යන කරුණ බලපාන්නට ඇතිබවට ඉතිහාසඥයින් තුළ මතයක් පවති. එයට හේතු ගණනාවක් ඉදිරිපත් වී ඇත. විශේෂයෙන්ම අශෝකගේ ප්‍රතිපත්ති යටතේ බ්‍රාහ්මණයින්ගේ යාග කටයුතු සත්ව බිලිපූජා වලට යම් පහරක් වැදුණු බව පෙනී යයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් බ්‍රාහ්මණයින් මෞර්යයන්ට විරුද්ධව කටයුතු කරන්නට ඇති බව විශ්වාස කරයි. ඉන්දියාවේ පුරාණ ග්‍රන්ථ වල මෞර්යයන් හඳුන්වා ඇත්තේ **අසුර** යන අවඥා සහගත වචනයකිනි. එම නිසා බ්‍රාහ්මණයින් මෞර්යයන්ට එරෙහි වූ බවට මතයක් ඉදිරිපත් වේ. මෞර්යයන්ගේ පසුව බලයට ආ ප්‍රධාන රාජවංශ හතරම බ්‍රාහ්මණ වංශිකයන් බව පෙන්වාදෙන ඉතිහාසඥයින් මෞර්යනට එරෙහිව බ්‍රාහ්මණයින්ගෙන් විරෝධතාවයක් පවතින්නට ඇති බව පෙන්වා දේ. මෙම බ්‍රාහ්මණ රාජවංශ ලෙස ඉතිහාසඥයින් අවධානයට යොමු කරන්නේ ශුංග කාණ්ව, සාතවාහන, චේත යන රජවංශයි. මෙයින් ශුංග හා සාතවාහකයින් බ්‍රාහ්මණයින් නොවන බවට අදහස් ඉදිරිපත්ව ඇත. පුශ්‍යමිත්‍ර ශුංග බලයට පත්වීමෙන් පසුව ඔහුගේ ජයග්‍රහණ වලින් පසු අශ්වමේධ නම් වූ යාග 2ක් පවත්වා ඇති බවද

මූලාශ්‍ර සාධක ඇත. කාලයක් තිස්සේ වැළලී ගිය බ්‍රාහ්මණ සම්ප්‍රදාය නැවත වරක් මෞර්යනට පසුව හිස එසවීම මගින් මෞර්ය ශිෂ්ටාචාරයේ බිඳවැටීමක් සිදු වූ බව පැහැදිලි වේ.

## 05. මෞර්ය අධිරාජ්‍යයේ විශාලත්වය එහි පරිහානියට බලපෑ බව

කාවේරි නදියෙන් එතෙර පිහිටි දකුණේ ද්‍රවිඩ රට හැර මුළුමහත් ඉන්දියාවම වසා පැතිර පැවති සුවිසල් මෞර්ය අධිරාජ්‍ය එහි විශාලත්වය නිසාම බිඳ වැටුණු බවට මතයක් පවතී. මූලික බලකේන්ද්‍රස්ථානයෙන් දුරස්ව පිහිටා තිබීම සහ ප්‍රවාහන සන්නිවේදන ජාලාවන්හි තිබුණු දුෂ්කරතා හේතුවෙන් ප්‍රාදේශීය පරිපාලනය දුෂ්කර විය. බින්දුසාර, චන්ද්‍රගුප්ත, මෞර්ය යන රජවරුන්ගේ කාලවලදී පවා ප්‍රාදේශීය පාලකයන් මෞර්යයන්ට එරෙහිව කටයුතු කිරීම පිළිබඳ සිදුවීම වාර්තා විය. බිංදුසාරා රජුගේ කාලයේදී තක්ෂිලාවේ ඇතිවූ කැරැල්ල නිළධාරීන්ගේ රාජද්‍රෝහී ක්‍රියාමගින් ඇතිවූ බවට තොරතුරු වාර්තා වී ඇත. මෞර්ය පාලනයේ බිඳවැටීමට රාජ්‍යයේ විශාලත්වය බලපෑ බව දක්වන ඉතිහාසඥයින් රාජ්‍යයේ මධ්‍ය බලය ස්ථාවර නොවූ අවස්ථාව වල ප්‍රත්‍යන්ත ප්‍රදේශ නැවත නැගී සිටි බව පෙන්වා දේ. ඩෙකානය, කාලිංගය, ඉන්ද්‍ර නිම්න ප්‍රදේශය ක්‍රමයෙන් මෞර්යයන්ගේ ගිලිහී ගිය පසු ඔවුන්ගේ බලය දුර්වල වීම සිදුවූ බවත් එහි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය බිඳවැටුණු බවටත් මතවාද පවතී.

## 06. අශෝක රජුට එල්ලවන චෝදනා

මෞර්ය අධිරාජ්‍යය බිඳවැටීමට වගකිව යුතු තවත් පුද්ගලයෙකු ඇති බවට සුවිශේෂී මතයක්ද මේ අතර ඉදිරිපත් වේ. එනම් මෞර්යයන්ගේ බලය ඉහළ තැනට රැගෙන ගිය අශෝක අධිරාජ්‍යයා මෞර්යයන්ගේ බිඳවැටීමට වගකිව යුතුය යන මතයයි. අශෝකට එරෙහිව එල්ල වන චෝදනා වන්නේ.

- ඔහුගේ ධාර්මික ප්‍රතිපත්ති නිසා යුද්ධ කිරීම වෙනුවට දහම් බෙර වැයීම සුදුසුය යන දේශපාලන දර්ශනය මෞර්ය රජවරුන්ට බාධාවක් වූ බව
- මෞර්යයන්ගේ යුධ හමුදාව හා සාමාන්‍ය ජනතාව රණකාමීන් කිරීම වෙනුවට අවිහිංසාවාදීන් කිරීමට අශෝක පාර කැපූ බව
- යුධ හමුදාව අකර්මන්‍ය වීම කෙරෙහි අශෝකගේ ප්‍රතිපත්ති බලපා ඇති බව
- අශෝකට පසුව බලය දැරිය හැකි ශක්තිමත් නායකයෙකු නොසිටීම
- මෞර්යයන්ගේ ධනය විශාල ප්‍රමාණයක් බෞද්ධ ආගමික සංවර්ධන කටයුතු සඳහා යෙදීම
- අශෝකගේ ප්‍රතිපත්ති බ්‍රාහ්මණ විරෝධතා උත්සන්න කිරීමට බලපා ඇති බවට වන චෝදනා

මෙම චෝදනා වලට අශෝක වග උත්තරකරු කරන ඇතැම් ඉතිහාසඥයින් මෞර්ය අධිරාජ්‍ය බිඳවැටීමට අශෝක විසින්ම අඩිතාලම දමා ඇති බවට සුවිසල් චෝදනාවක් ඉදිරිපත් කරයි. නමුත්

තවත් ඉතිහාසඥයින් පිරිසක් උක්ත චෝදනා පත්‍රයෙන් අශෝක නිදොස් කොට නිදහස් කිරීමට උත්සාහ ගන්නා බවටද ඉදිරිපත් කොට ඇත. මෞර්ය බිඳවැටීමට අශෝක වගකිව යුතු නොමැති බවට ඉදිරිපත් වන ප්‍රතිඋත්තර පහත දැක්වේ.

- අශෝක අධිරාජ්‍යයා කිසිමවිටෙක යුධ හමුදාව විසුරුවා නැත.
- අශෝක තම දරු මුණුපුරන්ට යුද්ධය තහනම් කර නැත.
- බෘහද්රථ රජුගේ කාලයේ පවා යුධ හමුදාව ශක්තිමත්ව සිටි බවත්, සේනාධිපති හා විශාල බලයක් තිබූ බවද පෙනී යයි.
- පසුකාලීන පාලකයන් දුර්වල වීම අශෝකගේ වරදක් නොව එය පැවති සමාජ වාතාවරණය අනුව ඇතිවූ තත්වයක් වන බව ඉදිරිපත් වන මතය.
- අශෝක බුද්ධාගමට පමණක් අනුග්‍රහ නොකල බවත්, ඔහුගේ සෙල්ලිපි සෑම ආගමකටම සැලකිය යුතු බවටත් අදහස් දක්වා තිබීම.
- අශෝකට බ්‍රාහ්මණ විරෝධයක් නොතිබෙන්නට ඇති බවටත් රාජතරංගනිය ලියූ කල්හාන, නම් බ්‍රාහ්මණයා අශෝක ගැන ප්‍රශංසාවෙන් කතාකළ බවටත් අදහස් ඉදිරිපත් වී ඇත.
- අශෝකගෙන් පසු දරු මුණුපුරන් පවා විවිධ ආගමික දර්ශන පිළිගැනීම නිසා ආගමික සහනශීලීත්වයක් ඇතිවූ බව.
- අශෝක කිසිම විටෙක බදු මුදල් අවලංගු කර රාජ්‍ය ආර්ථිකය දුර්වල කොට නැත.

මෙම කරුණු අනුව අශෝක මෞර්ය අධිරාජ්‍යයේ බිඳවැටීමට වගකිව යුතුය යන චෝදනාව එල්ල කිරීම කොතෙක් දුට සාධාරණ දැයි ප්‍රශ්නයක් අපට මතුවේ.

ලෝකයේ ඕනෑම රාජධානියක නැගීමක් මෙන්ම පහත වැටීමක් දැකිය හැකිය. අශෝක යටතේ බලයේ උච්චස්ථානයට පත් මෞර්ය අධිරාජ්‍යය විවිධ හේතු නිසා ක්‍රමයෙන් බිඳවැටුණු බව ඉහත කරුණු අනුව පැහැදිලි වේ.

උක්ත සාකච්ඡා කරන ලද සෑම කරුණක්ම මෞර්යයන්ගේ පරිහානියට හා බිඳවැටීමට ඉවහල් වන්නට ඇති බව විවිධ ඉතිහාසඥයින්ගේ අදහසයි.

# චෝල අධිරාජ්‍යය

ආචාර්ය දර්ශන බණ්ඩාර

දකුණු ඉන්දියාවේ ප්‍රධාන ජනවර්ගයක් වූ චෝලයින් තම පාලනයට වරින්වර රජවරු පත්කරගෙන සිටි බව මූලාශ්‍රවලින් පැහැදිලි වුවද ප්‍රබල අධිරාජ්‍යයක් ලෙස චෝලයන්ගේ නැගීම දැකිය හැකි වන්නේ ක්‍රිව 9 වන සියවසේ මැද භාගයේ දීය. පළමුවන චෝල රජු ලෙස හඳුනාගත හැක්කේ විජයාලය නම් චෝල රජුය. විජයාලය රජු එවකට තන්ජෝරයේ පාලකය ාවූ පාණ්ඩ්‍යයන්ගේ අවනත රජකු වූ මුත්තර්අයියර්ගෙන් තන්ජෝරය පැහැරගනී. මෙම සිදුවීම ක්‍රිව 846 දී සිදුවන අතර ඔහු ක්‍රිව 871 දක්වා තන්ජෝරය පාලනයකරයි. නමුත් විජයාලය රජු එවකට ප්‍රබල පල්ලව රජුගේ සාමන්ත පාලකයෙකු ලෙස කටයුතු කළ බව පෙනේ.

විජයාලගෙන් පසු බලයට පත්වන ඔහු පුත් පළමු ආදිත්‍ය (841 - 907) චෝල බලය ස්වාධීන කරයි. ක්‍රිව 880 දී සිදුවූ ශ්‍රී පුරම්බියම් සටනේදී පල්ලවයින් සහ පාණ්ඩයන් එකිනෙකාට විරුද්ධව යුධ වදී. මේ අවස්ථාවේ පළමු ආදිත්‍ය රජු පල්ලව රජුගේ පාර්ශ්වයේ සටනට දායකවන අතර පල්ලවයන් විසින් පාණ්ඩයන් පරාජයට පත් කරයි. කෘතගුණ සැලකිමට කල්පනා කරන අපරාජිත වර්මන් පල්ලව රජු ආදිත්‍යයට තන්ජෝරයේ ස්වාධීනත්වය ලබාදෙයි. තවත් වසර 13ක් ගතවන විට ක්‍රිව 893දී ආදිත්‍ය රජු පල්ලව රජුද පරාජයට පත් කොට තොන්ඩේ මණ්ඩලයෙහි බලය පිහිටුවා ගනී. එමෙන්ම කොංගු දේශයටද බටහිර ගංගයින්ට අයත් තලකඩ් නුවරද අල්ලා ගැනිමට සමත් වේ.

<u>**පළමු පරන්තක (ක්‍රිව 907 - 953)**</u>

ආදිත්‍යගෙන් පසු ඔහුගේ පුත් පළමු පරන්තක බලයට පත්වන අතර අඩ සියවසකට ආසන්න කාලයක් ඔහු දකුණු ඉන්දියාවේ පාලන බලය මෙහෙවයි. හෙතෙම පාණ්ඩ්‍ය අගනගරය වූ මදුරාව ජයගෙන "මදුරෙයි කොන්ඩෙයි" නම් විරුදාවලියක් භාවිතා කොට ඇත. එමෙන්ම දෙවන වරට පාණ්ඩයන් ලංකාවේද ආධාර ඇතිව දෙවන රාජසිංහම් පාණ්ඩ්‍ය යටතේ චෝලයන්ට එරෙහිව කල සටනද වෙල්ලූර්හිදි පරාජයට පත් කිරිමට පරන්තකට හැකිවිය. ක්‍රිව 920 දී තුන්වන වරටත් පාණ්ඩයන් පරාජයට පත් කිරිමට පරන්තක සමත්විය. පාණ්ඩ්‍ය රජු ආරක්ෂාව පතා ලංකාවට පලා විත් ලක් රජු ලග ඔහුගේ කිරිටය සහ රාජකකුධ භාණ්ඩ තබානැවත කේරළයට පලායයි. මෙම සිදුවීම ලංකාවේ 4වන දප්පුල රජුගේ කාලයේදී සිදුවූ බව විශ්වාස කෙරේ. පසුව පරන්තක 4 වන උයද රජුගේ කාලයේදී අදාල භාණ්ඩ ලබා ගැනීමට ලංකාවට ආක්‍රමණයක් එල්ල කරන අතර ඔහු තම අරමුණ සාර්ථක කර ගනී. ඉන්පසු තම නමට "මදුරෙහි ඊලාම් කොන්ඩෙයි" යන විරුදය එක්කර ගනී. පළමු පරන්තක දෙවන කෘෂ්ණ නම් රාෂ්ට්‍රකූට පාලකයෙකු පරාජයට පත් කර ඇති නමුත් (තුන්වන කෘෂ්ණ රජු) තක්කෝලම් සටන ජය ගැනිමට අපොහොසත් විය.

පළමු පරන්තක ගෙන් පසු බලයට පත්වූ රාජදිත්‍ය, බණ්ඩාරදිත්‍ය, දෙවන ආදිත්‍ය, දෙවන පරන්තක ආදි පාලකයන් බලයට පත්වුවත් ඔවුන් ප්‍රබලයන් නොවූ බව පෙනේ.

## පළමු රාජරාජ රජු (ක්‍රිව 985 - 1014)

දකුණු ඉන්දියාවේ ප්‍රාදේශිය රාජ්‍යක් වූ චෝලයන්ගේ අධිරාජ්‍ය සයුරෙන් එතෙර ප්‍රදේශ වලට ව්‍යාප්ත කිරීමේ පුරෝගාමියා පළමු රාජ රාජ වේ. පළමු රාජරාජ රජු සුන්දර චෝලගේ පුත්‍රයා ලෙස සැලකේ. ඔහු සිදු කළ සටන් විශාල සංඛ්‍යාවක් වේ.

- ත්‍රිවේන්ද්‍රම සටන

කේරලයේ රජු වූ භාෂ්කර් රාජවර්මන් පරාජයට පත් කොට ඔවුන්ගේ නාවික බලය විනාශ කරයි.

- මදුරාව ජයගෙන අමරභුංග පාණ්ඩ්‍ය රජු අල්ලාගැනීම
- කුඩමලෙහි නාඩු සටනින් උදගෙයි බලකොටුව අත්පත් කර ගැනීම
- ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශය අල්ලා ගැනිම
- ගංගා රට ආක්‍රමණය කොට තලගවාඩිය,නොලම්බවාඩිය, ගංගාවාඩිය යන ප්‍රදේශ අල්ලා ගැනීම
- බටහිර චාලුක්‍ය දේශය ආක්‍රමණය කිරිම,. (ෂත්‍යාශ්‍රය රජු නැවත බලයට පත් වී චෝල බලය මර්ධනය කොට ඇත)
- කාලිංග රාජ්‍ය ජයග්‍රහණය කිරිම.
- දූපත් දොලොස්දහසේ රට ආක්‍රමණය කිරිම (මාලදිවයින)
- ආන්ද්‍රා ප්‍රදේශය ආක්‍රමණය කොට අවනත පාලකයෙකුට එය භාරදීම

මෙම කරුණු අනුව දෙවන රාජරාජ චෝල බලය ව්‍යාප්ත කිරිම සඳහා ප්‍රබල භුමිකාවක් රග දක්වූ බව පැහැදිලිව හඳුනාගැනීමට හැකිය. ඔහු නැගෙනහිර චාලුක්‍යයන් සමග මිත්‍ර සම්බන්ධයක් පවත්වමින් තම දියණිය වූ කුන්දවා විමලාදිත්‍ය චාලුක්‍ය රජුගේ සොහොයුරාට විවාහ කර දෙයි. ඔහුගේ බලය පෙන්වීම සඳහා ඔහු භාවිතා කළ විරුද නාම කීපයක් සෙල්ලිපි වල දක්වේ. මුම්මඩි චෝල. කේරලාන්තක, පාණ්ඩ්‍යකුලශානි,තෙළිගුකුලකාල, ව්‍යාඝ්‍ර ආදී සටන් කීපයක නිරත වූ ඔහු රාජ්‍ය පරිපාලනය ශක්තිමත් කොට සියලු රාජ්‍ය ඉඩම් සමික්ෂණ කළ බවද දක්වේ. රාජරාජේෂ්වර කෝවිල ඔහුගේ නිර්මාණයකි.

## පළමු රාජේන්ද්‍ර (1014 - 1044)

චෝලයන්ගේ බිහිවූ විශිෂ්ටතම රණකාමියා ලෙසද මොහු හැඳින්වේ. තම පියා යටතේ 10.. සිටම මොහු රජ පදවිය දරා ඇත. ශ්‍රී ලංකාව ආක්‍රමණය කළ හෙතෙම ක්‍රි ව 1018 දී රුහුණෙ සැඟවී සිටි 5 වන මහින්ද රජු අත් අඩංගුවට ගෙන තම රටට රැගෙන යයි. එමෙන්ම ලංකාවේ රජුගේ රාජකකුධ භාණ්ඩද ඔහු රැගෙන ගිය අතර ලංකාවේ පාලනයට දණ්ඩනායක මුවෙන්තමෙලාර් නම් පාලකයෙක් පත් කොට ඇත. සියවස් 13කකට අධික කාලයක් පැවති අනුරාධපුර රාජ්‍ය අතහැර පොලොන්නරුව පළමුවරට අගනගරයක් කරගන්නේ පළමු රාජේන්ද්‍ර ගේ කාලයේය.

ලංකාව මෙන්ම කේරලයද ඔහු යටත් කර ගන්නා අතර එහි පාලනය තම පුත්‍රයාට ලබාදෙයි. ක්‍රිව 1021 දී බටහිර චාලුක්‍ය රජු වූ ජයසිංහ පරාජයට පත් කරන අතර සැලකිය යුතු ප්‍රදේශයක් මොහු අල්ලාගෙන ඇත. උතුරු ඉන්දියාවේ නැගෙනහිර ප්‍රදේශ වලටද ක්ෂණික ආක්‍රමණයක් පළමු රාජේන්ද්‍ර සිදු කොට ඇත. ඉන්දියාවේ ගංගා නදියේ ජලය රැගෙන විත් තම රාජ්‍ය අලුතින් පිහිටවූ ගංගෙහි කොණ්ඩ චෝළපුරම් නම් වැවේ ජලයට එක් කළ බව ඔහුගේ මූලාශ්‍රවල දක්වේ. නමුත් මෙම ආක්‍රමණය ක්ෂණික එකක් විය හැකි බව පෙනී යයි. ඉන්දියානු සාගරයේ වෙළඳ ඒකාධිකාරය පිළිබඳ ශ්‍රී විජයරාජ්‍ය සමඟ ගැටුණු බව පෙනේ. ක්‍රිව 1025 දී අග්නිදිග ආසියාවේ පිහිටි කඩාරම් වෙත ඔහු ආක්‍රමණයක් එල්ල කරයි. අග්නිදිග ආසියාතික සුමාත්‍රා මැලේ ජාවා ප්‍රදේශ වල බලය ව්‍යාප්ත වීමටත් නිකොබාර් දූපත් අල්ලා ගැනීමටත් ඔහු සමත් වේ.

ක්‍රි ව 1029 දී ලංකාවේ සහ කේරළයේ ඇති වූ විමුක්ති සටන් ඔහුගේ පුත් පළමු රාජාධිරාජ ලවා දරුණු ලෙස මර්දනය කරයි. මොහු හැඳින්වීම සඳහා "ගංගෙයිකොණ්ඩ", "කඩාරම් කොණ්ඩ", "මුම්මඩි කොණ්ඩ", "පණ්ඩිත චෝල" ආදි විරුදාවලි භාවිතා කොට ඇත.

ඉන්පසු බලයට පත් වන්නේ පළමු රාජාධිරාජ රජු (1044 - 1052) මොහු 1018 සිටම තම පියාගේ පාලනයට සම්බන්ධ වී ඇත. ලංකාවේ විමුක්ත සටන් මර්ධනය කිරිමට ඔහු කටයුතු කළ අතර පාණ්ඩ්‍ය සහ සිංහල කුමාරවරු ගණනාවක් ඔහු ඝාතනය කොට ඇත. චෝලයන්ගේ දේශපාලන බල ව්‍යාප්තියේදී ක්‍රිව 1052 දී සිදුවූ කොප්පම් සටන වැදගත් වේ. බටහිර චාලුක්‍යන් සමඟ පැවති සටනේදී යුධ පෙරමුණේ ඉදිරිපෙළ සටන් කළ රාජාධිරාජ රජු සටන් බිමේදීම මිය යයි. සටන් බිමේදීම ඔටුනු පැළඳි ඔහුගේ සොයුරු දෙවන රාජේන්ද්‍ර චාලුක්‍ය පාලනය ඇවත පරාජ කරයි. නමුත් රණකාමී චෝල රජු සටන් බිමේ මියයාම චෝලයන්ගේ අවනතියට හේතු විය. මින් වසර 3ක් ගත වන විට ලංකාවේ විජයබාහු රජු චෝල ආධිපත්‍ය ලංකාවෙන් අතුගා දමයි.

ඉන්පසු බලයට පත්වූ පළමු වීර රාජේන්ද්‍ර, අධිරාජේන්ද්‍ර, පළමු කුලෝතුංග යන පාලකයන් පෙර රජවරුන් මෙන් ප්‍රබලයන් නොවිය. චෝලයන්ගේ පාලනය දකුණු ඉන්දියාවේ කුඩා ප්‍රදේශයකට සීමා විය. මේ යුගයේදී පාණ්ඩ්‍ය සිහසුන නැවත වතාවක් ශක්තිමත් වේ.

කුලසේකර පාණ්ඩ්‍යයට චෝලයන් උදව් කරන අතර පරාක්‍රම පාණ්ඩ්‍යයට ලංකාව උදව් කරයි. දෙපිරිසේම පිරිස් පාණ්ඩ්‍ය සිංහාසන අරගලයේදී විනාශයට ලක්වේ. චෝල රාජ්‍යයේ සහ සිංහල රාජ්‍යයේ සුන්බුන් මත දෙවන පාණ්ඩ්‍ය අධිරාජ්‍ය නැගී ආ බව ඉතිහාසඥයන් විශ්වාස කරයි. දකුණු ඉන්දියාවේ විශිෂ්ට පාලන ක්‍රමයක් ලෙස චොලයන්ගේ පාලනය අපට හඳුන්වාදිය හැකිය. ද්‍රවිඩ සංස්කෘතිය ව්‍යාප්ත කිරිමට චොලයන්ගේ විශාල මෙහෙයක් ඉටු විය.